# පාස්කු ප්‍රහාරය හා සබැඳිව කොළඹ මහාධිකරණයේ විභාග වන නඩු ත්‍රිත්වයක් සම්බන්ධයෙන් 2021 නොවැම්බර් මස 22 වන දින සිට 2021 දෙසැම්බර් මස 15 වන දින දක්වා අධිකරණ ක්‍රියාමාර්ග පිළිබඳ සමස්ත නිරීක්ෂණ වාර්තාව[1]

2019 අප්‍රේල් මස 21 වන දින එනම්, පාස්කු ඉරුදින සිදු වූ බෝම්බ ප්‍රහාරය හා සබැඳිව හිටපු පොලිස්පතිට එරෙහිව, හිටපු ආරක්ෂක ලේකම්වරයාට එරෙහිව සහ සැකකරුවන් 25 දෙනෙකුට එරෙහිව කොළඹ මහාධිකරණයේ වෙන් වෙන් වශයෙන් නඩු ත්‍රිත්වයක කටයුතු ආරම්භ කර ඇත.

පටුන

**1 වැනි කාණ්ඩය : සාරාංශ වගුව (Summary table)**.......... 2

**2 වැනි කාණ්ඩය : නවුෆර් මවුලවී ඇතුලු විත්තිකරුවන් 25 දෙනෙකුට එරෙහි නඩුවේ විශේෂ කරුණු - HC (TAB) 2972/21** .......... 4

**3 වැනි කාණ්ඩය : හිටපු පොලිස්පතිට එරෙහි නඩුවේ විශේෂ කරුණු - HC (TAB) 2900/21**.......... 5

**4 වැනි කාණ්ඩය : හිටපු ආරක්ෂක ලේකම්ට එරෙහි නඩුවේ විශේෂ කරුණු - HC (TAB)2021/2899** .......... 9

## 1වැනි කාණ්ඩය : සාරාංශ වගුව (Summary table)

| | HC (TAB) 2972/21 | HC (TAB) 2900/21 | HC (TAB) 2899/2021 |
|---|---|---|---|
| චූදිත / විත්තිකරු | නවුෆර් මවුලවී ඇතුළු විත්තිකරුවන් විසි පස් දෙනෙකු | හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර | හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු |
| විනිසුරුවරුන් | දමිත් තොටවත්ත, අමල් රණරාජා, නවරත්න මාරසිංහ යන ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල[2] | නාමල් බලල්ලේ, ආදිත්‍ය පටබැඳිගේ සහ මොහොමඩ් ඉර්ෂඩීන් යන මහත්වරුන්ගෙන් සමන්විත ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුල්ල[3] | නාමල් බලල්ලේ, ආදිත්‍ය පටබැඳිගේ සහ මොහොමඩ් ඉර්ෂඩීන් යන මහත්වරුන්ගෙන් සමන්විත ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුල්ල[4] |
| චූදිතයන් / විත්තිකරුවන් සඳහා වූ නීතිඥවරුන් | 6 වන විත්තිකරු වෙනුවෙන් නීතිඥ නුර්දීන් එම්. ෂහීඩ් ද, (Noordeen M. Shaheed), 22, 23 සහ 24 යන විත්තිකරුවන් වෙනුවෙන් නීතිඥ විජිතානන්ද මඩවලගම (Vijithananda Madawalagama) පෙනී සිටියි. | නීතිඥ දුලාන් මිරිහාන, ප්‍රියංග ගුණරත්න, නිර්මල කොඩිතුවක්කු සහ ජයන්ත තිලකරත්න සමඟ නීතිඥ රෝෂාන් දෙහිවල [5] | ජනාධිපති නීතිඥ මොහාන් වීරකෝන් මහතා ඇතුළු නීතිඥ මඩුල්ලක්[6] |
| රජයේ නීතිඥවරුන් | හරිප්‍රිය ජයසුන්දර (SDSG Haripriya Jayasundara), ලක්මාලි දිසානායක (SC Lakmali Dissanayake) සහ තවත් නීතිඥවරුන් | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් දිලීප පීරිස් මහතා ඇතුළු නීතිඥ මඩුල්ලක් | නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් සුදර්ශන ද සිල්වා මහතා ඇතුළු නීතිඥ මඩුල්ලක් |

| | | | |
|---|---|---|---|
| අගතියට පත් පාර්ශ්වයන් සඳහා වූ නීතිඥවරුන් | ජනාධිපති නීතිඥ නෙවිල් අබේරත්න (Nevil Abeyrathna PC**)**, ජනාධිපති නීතිඥ රියෙන්සි අර්සකුලරත්න (Riyanzi Arsakularathna PC), නීතිඥ සුරේන් ඩී. පෙරේරා (Suren D. Perera) හා නීතිඥ ශෂිකා සේනාරත්න (Sashika Senarathna) | - | - |
| නඩුව අධිකරණයේ අසන ලද / කැඳවන ලද දින (* සලකුණ මගින් CSR විසින් අදාළ නඩු විභාග නිරීක්ෂණය කළ දිනයන් දක්වයි) | 2021.11.23***** | 2021.11.22*****<br>2021.11.23*****<br>2021.11.24*****<br>2021.11.25*****<br>2021.11.26*****<br>2021.11.29 | **2021.11.22**<br>**2021.11.23**<br>**2021.11.24**<br>**2021.11.25***<br>**2021.11.26***<br>2021.12.13*<br>2021.12.14*<br>2021.12.15* |
| ඊළඟ නඩු දිනය සහ වේලාව | 2022.01.12 | 2022.01.18 | 2022.01.18 – 1.30pm |

ඉහත සඳහන් එක් එක් නඩුවේ සිදු වූ සුවිශේෂී කරුණු මින් ඉදිරියට මෙම වාර්තාව තුළ විස්තර කෙරේ.

## 2 වැනි කාණ්ඩය : නවුෆර් මවුලවී ඇතුලු විත්තිකරුවන් 25 දෙනෙකුට එරෙහි නඩුවේ විශේෂ කරුණු - HC (TAB) 2972/21

2021 නොවැම්බර් මස 23 වන දින පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාර මාලාව සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලැබූ නවුෆර් මවුලවී ඇතුළු විත්තිකරුවන් 25 දෙනෙකුට එරෙහිව නීතිපතිවරයා විසින් පවරා ඇති නඩුව කැඳවනු ලැබූ[7] අතර, 2022 වර්ෂයේ ජනවාරි 12 වනදා දක්වා කල්තැබීමට කොළඹ විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඬුල්ල මෙදින නියෝග කරන ලදී[8]. දැඩි ආරක්ෂාවක් යටතේ විත්තිකරුවන් මෙදින අධිකරණයට ඉදිරිපත් කරන ලදී[9]. තමන්ට එරෙහි අධිචෝදනාපත්‍ර දෙමළ භාෂාවෙන් ලබාදෙන ලෙස විත්තිකරුවන් එහිදී අධිකරණයෙන් ඉල්ලා ඇති අතර, ඒවා සකස් කිරීමට කල් ලබා දෙමින් නඩු විභාගය කල් තබා ඇත[10]. මෙදින නඩුව කැඳවූ අවස්ථාවේදී විත්තිකරුවන් 10 දෙනෙකුට නීතිඥවරුන් ඉදිරිපත් වී නැත[11]. ඒ අනුව දෙමළ භාෂාව දන්නා නීතිඥවරුන් ඉදිරිපත් කරන ලෙස ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිවරයාට සිහිකැඳවීමක් යැවීමටද අධිකරණය නියෝග කරන ලදී[12].

## 3 වැනි කාණ්ඩය : හිටපු පොලිස්පතිට එරෙහි නඩුවේ විශේෂ කරුණු - HC (TAB) 2900/21

2021 නොවැම්බර් මස 22 වන දින පෙරවරුවේ පූජිත් ජයසුන්දර මහතා ත්‍රිපුද්ගල මහාධිකරණය හමුවේ පෙනී සිටියේය[13]. 2019 පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය සම්බන්ධයෙන් බුද්ධි අංශ පූර්ව අනතුරු ඇඟවීම් ලැබී තිබියදීත් ක්‍රියා නොකිරීම හේතුවෙන් සාපරාධී නොසැලකිල්ල (Criminal negligence) සම්බන්ධයෙන් ඔහුට චෝදනා එල්ල විය (චෝදනා 855ක් හා සාක්ෂිකරුවන් 1200ක් පමණ)[14]. පූජිත් ජයසුන්දර මහතා වෙත චෝදනා කියවා ඇති අතර ඔහු තමන් නිවැරදිකරු බව ප්‍රකාශ කර ඇත[15]. පැමිණිල්ල විසින් ඉදිරිපත් කර ඇති කරුණු 33ක් සාක්ෂි මෙහෙයවීමකින් තොරව හා අවසරයකින් තහවුරු කිරීමකින් තොරව විත්ති පාර්ශවය පිළිගන්නා බව විත්තිකරුගේ නීතිඥවරයා පෙන්වා දී ඇත[16]. පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා හා අධිකරණ වෛද්‍ය වාර්තා පිළිගන්නා ලදී[17].

2021 නොවැම්බර් 23 වන දින ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් දිලීප පිරිස් මහතා විසින් හිටපු රාජ්‍ය බුද්ධි සේවා ප්‍රධානී නිලන්ත ජයවර්ධන (**Chief of former State Intelligence Services Chief Nilantha Jayawardhana)** මහතාගේ සාක්ෂි මෙහෙයවන ලදී[18]. ඔහුට අනුව, SIS (**State Intelligence Service)** විසින් පොලිස්පතිවරයාට සහ ආරක්ෂක ලේකම්වරයාට ක්‍රියා කිරීම සඳහා තොරතුරු ලබා දෙන අතර SIS හට තොරතුරු රැස් කිරීම හැර වෙනත් කිසිදු මෙහෙයුමකට සම්බන්ධ විය නොහැක[19]. ඔහු සහරාන් හෂීම් පිළිබඳ තොරතුරු පොලිස්පති සහ ආරක්ෂක ලේකම් වෙත ලබා දී ඇත[20]. ඔහු ඔවුන් වෙත වාර්තා 340ක් පමණ යවා ඇත[21].

2021 නොවැම්බර් මස 24 වන දින රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු ප්‍රධානී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා පැමිණිල්ලේ සාක්ෂිකරුවකු ලෙස සාක්ෂි ලබා දෙන ලදී. එම මහතා සාක්ෂි ලබා දෙමින් සඳහන් කළේ, 2017 ඔක්තෝම්බර් 31 වන දා, තමා විසින් පොලිස්පතිවරයා අමතා යොමු කළ ලිපියක් මඟින් මෙරට තුළ IS මතවාදය පතුරවන සහ අනාගත ප්‍රහාරයක් සඳහා යොමු විය හැකි පුද්ගලයන් 94 දෙනෙකු පිළිබඳ තොරතුරු ලබා දුන් බවයි[22]. පාස්කු ඉරුදින දෙහිවලදී මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයක් එල්ල කළ ජමීල් නැමැත්තා එම නාම ලේඛනයේ අංක 10ට ඇතුලත් කර තිබූ බවත්, සහරාන් හෂීම්, මොහොමඩ් රිල්වාන්, මොහොමඩ් මිල්හාන්, නවුෆර් මවුලවී යන පුද්ගලයින්ගේ නම් ද ඊට ඇතුලත්ව තිබූ බව සාක්ෂිකරු කියා සිටින ලදී[23]. එමෙන්ම, පැමිණිල්ලේ සාක්ෂි අංක 10 තෙක් විවිධ ලේඛන ලකුණු කිරීමක් මෙදින සිදු විය[24].

2021 නොවැම්බර් මස 25 වන දිනද පැමිණිල්ල වෙනුවෙන් නිලන්ත ජයවර්ධන මහතා සාක්ෂි ලබා දෙන ලදී. පැමිණිල්ලේ සාක්ෂි අංක 37 පමණ වන තෙක් ලකුණු කිරීමක් මෙදින සිදු විය[25]. පැමිණිල්ලේ සාක්ෂි අංක 32, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති සෙනෙවිරත්නට යොමු කරන ලද්දක් බවත් එය සමඟ ඇමුණුමක්ද වන බවත් ප්‍රකාශ විය[26]. ලංකාව පුරා ISIS වලට සම්බන්ධ 129ක් පුද්ගලයන් පිළිබඳ අතිරහස්‍ය වාර්තාවක් බවට ප්‍රකාශ කරන ලදී[27]. 2019 වර්ෂයේ ජනවාරි මාසයේ වනාතවිල්ලුව ප්‍රදේශයෙන් අවි ආයුධ ලැබීමක් සම්බන්ධයෙන් ද ප්‍රකාශ

විය[28]. ප්‍රහාරය සම්බන්ධ මුල් තොරතුර 2019 අප්‍රේල් මස 04 වන දින සාක්ෂිකරුට විදේශීය තොරතුරුකරුවකුගෙන් WhatsApp මාර්ගයෙන් ලැබී ඇති බවට ප්‍රකාශ විය[29]. සාක්ෂිකරු තොරතුරුකරු වෙත දුරකථන ඇමතුමක් ලබා දී ඇති බවටත් ප්‍රකාශ විය[30]. එම ලැබුණු තොරතුර නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයාට හා සහකාර අධ්‍යක්ෂකවරුන්ට සාක්ෂිකරු දැනුවත් කර තොරතුර develop (වැඩි දියුණු කරනවා) කිරීමට දන්වා ඇති බවට ද ප්‍රකාශ විය[31]. අදාළ තොරතුර ලිඛිතව අවශ්‍ය බව තොරතුරුකරු වෙත දන්වා ඇති අතර එම තොරතුර 5 වන දින ලිඛිතව ලබා දී ඇති බවට ද ප්‍රකාශ විය[32].

2021 නොවැම්බර් මස 26 වන දිනද, දිලීප පීරිස් මහතා පළමු සාක්ෂිකාර නිලන්ත ජයවර්ධන මහතා සම්බන්ධයෙන් සාක්ෂි මෙහෙයවූ අතර, සාක්ෂි ලබාදෙමින් සාක්ෂිකරු කියා සිටියේ 2019 අප්‍රේල් 04 දින රහස් නියෝජිතයකු හරහා කතෝලික පල්ලි ඇතුළු ස්ථාන 08 කට පහර දීම් සිදුවන බවට මූලික තොරතුරු ලැබුණු බවයි[33]. ප්‍රධාන ප්‍රහාරයට සමගාමීව 2019 අප්‍රේල් 16 වන දින කාත්තන්කුඩි ප්‍රදේශයේදී මෝටර් බයිසිකලයක් පිපිරීමක් සිදු වූ බව සාක්ෂිකරු පවසන ලදී[34]. නැවතත් 2019 අප්‍රේල් 20 දින සවස, සාක්ෂිකරු වෙත අප්‍රේල් 21 වන දින සිදු වන පාස්කු ප්‍රහාරය පිළිබඳ විශ්වාසනීය ස්වභාවයේ තොරතුරු ලැබුණු බවක් පෙන්වයි[35].සාක්ෂිකරු සාක්ෂි දෙමින් පැහැදිලි කළේ තමා වෙත ලැබුණු තොරතුරු පොලිස්පති, ආරක්ෂක ලේකම් ඇතුළු නිලධාරීන් 08දෙනෙක් වෙත යැවූ බවයි[36]. මෙම නඩුවේ සාක්ෂි ලබාදීම සඳහා 2021 නොවැම්බර් 29 වනදා අධිකරණයේ පෙනී සිටින ලෙස විනිසුරු මඩුල්ල වත්මන් පොලිස්පති සී.ඩී වික්‍රමරත්න මහතාට මෙදින සිතාසි නිකුත් කරන ලදී[37]. පොලිස්පතිවරයා මෙම නඩුවේ 1214 වන සාක්ෂිකරුවාද වේ[38].

2021 නොවැම්බර් මස 29 වන දින, මෙම නඩුවට අදාළව වත්මන් පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න මහතා මෙදින සාක්ෂි ලබාදෙන ලදී[39]. නඩුවේ පළමු සාක්ෂිකාර නිලන්ත ජයවර්ධන මහතා වෙත හරස් ප්‍රශ්න යොමු කරමින් පූජිත් ජයසුන්දර මහතා වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා විමසා සිටියේ, ප්‍රහාරයට පෙර අප්‍රේල් 04 වනදා ලැබුණු විදෙස් පෙර දැනුවත් කිරීම අප්‍රේල් 20 වනදා දක්වා නිශ්චිත බුද්ධි තොරතුරක් බවට පත් කර ගැනීමට රාජ්‍ය බුද්ධි සේවය අසමත් වුණේද යන්නයි[40]. සාක්ෂිකාර නිලන්ත ජයවර්ධන මහතා ප්‍රකාශ කර සිටියේ, ප්‍රහාරයට පෙර දින පස්වරු 4.12ට විදෙස් බුද්ධි අංශ තොරතුරුකරුගෙන් තමන්ට යළි ඇමතුමක් ලැබෙන තුරු අප්‍රේල් 04 ලද තොරතුර නිශ්චිත බුද්ධි තොරතුරක් ලෙස තහවුරු කිරීමට තමන් ළඟ දත්ත නොතිබූ බවයි[41]. මෙහිදී විත්තියේ නීතිඥවරයා යළි ප්‍රශ්න කළේ අප්‍රේල් 04 සිට අප්‍රේල් 20 දක්වා වූ කාලය තුළ ඔබ විසින් එවකට පොලිස්පතිවරයාට ප්‍රහාරයක් පිළිබඳ නිශ්චිත බුද්ධි තොරතුරක් ලබා නොදුන් බව පිළිගන්නේද යන්නයි[42]. ඔව් මම පිළිගන්නවා, ප්‍රහාරයට පෙර දිනය වෙනකන් මම ප්‍රහාරයක් පිළිබඳ නිශ්චිත බුද්ධි තොරතුරක් ලබාදුන්නේ නැහැ. නමුත් මම අප්‍රේල් 04 ලද තොරතුර, සහරාන් හෂීම් අප්‍රේල් 16 කර තිබූ පෙර පුහුණුව වැනි දේ පිළිබඳව තොරතුරු ලබා දුන්නා[43], යැයි සාක්ෂිකරු පැවසූ බවට වාර්තා වේ.

20 වන දින පස්වරු 4.12 තොරතුර ලැබීමෙන් අනතුරුව 21 වන දින උදෑසන 8.27 වන තෙක් ඔබලා ගත් ක්‍රියාමාර්ග මොනවාද යනුවෙන් නීතිඥවරයා අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමින්

සාක්ෂිකාර ජයවර්ධන මහතා ප්‍රකාශ කර සිටියේ, 20 දින 4.12 තොරතුර ලැබුණු විට ඔහු පළමුව තොරතුරුකරුට කතා කළ බවත්, දෙවතාවක් ඔහුට කතා කර තොරතුර පිළිබඳ විස්තර ලබා ගත් බවත්, ඉන්අනතුරුව ඔහු ජාතික බුද්ධි ප්‍රධානියාට, පොලිස්පතිට, ආරක්ෂක ලේකම්වරයාට වට්ස් ඇප් මාර්ගයෙන් දැනුම් දුන් බවත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දැනුම් දුන් බවත්, බස්නාහිර පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති හා කොළඹ භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා වෙත දැනුම් දුන් බවත්ය[44]. නීතිඥවරයා ප්‍රශ්න කරමින්, මෙය වැදගත් තොරතුරක් වුණා නම් ඇයි ඔබ රටේ ප්‍රධානියාට කිව්වේ නැත්තේ යනුවෙන් විමසූ කල්හී ජයවර්ධන මහතා ප්‍රකාශ කර සිටියේ, අප්‍රේල් 20 වන දින සවස 6.20 පමණ ජනාධිපතිවරයා ඇමතීමට උත්සහ කළ බවත්, ඔහු සම්බන්ධවූයේ නැති බවත්ය[45]. මෙම බුද්ධි තොරතුරු තමා විසින් අග්‍රාමාත්‍යවරයා, ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා, විපක්ෂ නායකවරයා යනාදී කිසිවෙකුටත් දැනුම් නොදුන් බව සාක්ෂිකාර නිලන්ත ජයවර්ධන මහතා පිළිගන්නා ලදී[46].

මෙදින මෙම නඩුවේ පළමු සාක්ෂිකාර නිලන්ත ජයවර්ධන මහතාගේ දින පහක සාක්ෂි ලබාදීම අවසන් විය[47]. අනතුරුව වර්තමාන පොලිස්පතිවරයාගේ සාක්ෂි මෙහෙයවීම ආරම්භ විය. කෙසේනමුත් නියමිත වේලාවට පොලිස්පතිවරයා අධිකරණය හමුවේ පෙනී නොසිටීම මත අධිකරණය විනාඩි 15කට කල් තැබීය[48]. සාක්ෂිකරුවකු තමාට ඕන වේලාවට නොව අධිකරණය දැනුම් දෙන වේලාවට අධිකරණය හමුවේ පෙනී සිටිය යුතු බවට එම අවස්ථාවේ විනිසුරුවරයා ප්‍රකාශ කරන ලදී.[49]

පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් දිලීප පීරිස් මහතාගේ මෙහෙයවීම යටතේ සාක්ෂි දුන් පොලිස්පති වික්‍රමරත්න මහතා රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් පොලිස්පතිවරයාට පැවරී තිබෙන රාජකාරිය පැහැදිලි කරන ලදී. එනම්, පොලිස්පතිවරයා කියන්නේ, රාජ්‍ය ආරක්ෂාව හා සම්බන්ධ ප්‍රබල චරිතයක්. ඔහු ජාතික ආරක්ෂක කවුන්සිලයේ නිත්‍ය සාමාජිකයෙක්. ආරක්ෂක කවුන්සලයේ සිටින සාමාජිකයන් සියලු දෙනා හා සමාන බලතල පොලිස්පතිවරයාට තිබෙනවා. විධායකය විසින් ගනු ලබන තීරණ භූමියේ ක්‍රියාත්මක කරන්නේ, පොලිස්පතිවරයා ප්‍රමුඛ පොලිස් දෙපාර්තමේන්තුවයි. රාජ්‍ය ආරක්ෂාව හා දේශපාලනය සම්බන්ධ තොරතුරු පිළිබඳ රාජ්‍ය නායකයා දැනුවත් කිරීමේ වගකීමත් පොලිස්පතිවරයා වෙත පැවරී තිබෙනවා. පොලිස්පතිවරයා යනු හුදෙක් වැටුප් ලබන තවත් රාජ්‍ය නිලධාරියකු නොවෙයි.[50]

පොලිස්පතිවරයා වෙත යම් බුද්ධි තොරතුරක් ලැබුනහොත් ඒ සම්බන්ධයෙන් ඔහු විසින් ගත යුතු ක්‍රියාමාර්ග මොනවාද යනුවෙන් දිලීප පීරිස් මහතා විමසා ඇති අතර එයට පිළිතුරු ලෙස වත්මන් පොලිස්පතිවරයා පහත පරිදි ප්‍රකාශ කළ බවට වාර්තාවේ. එනම්, එවැනි තොරතුරක් ලැබුණු විට එය වැඩි දියුණු කරගෙන අදාළ අංශ වෙත යොමු කොට එය භූමියේ ක්‍රියාත්මක කිරීම පොලිස්පතිවරයාගේ වගකීමයි[51].

රාජ්‍ය බුද්ධි සේවයෙන් ලැබෙන බුද්ධි තොරතුරු පිළිබඳ ඔබ දරන ආකල්ප කුමක්ද යනුවෙන් දිලීප පිරිස් මහතා අසන ලද ප්‍රශ්නයට පිළිතුරු දෙමින්, රාජ්‍ය බුද්ධි සේවයෙන් ලබාදෙන තොරතුරු අර්ධ සත්‍ය හෝ නිවැරදි නොවන ඒවා ලෙස අප සලකන්නේ නැහැ. එම තොරතුරු සත්‍ය ඒවා ලෙස පූර්ව නිගමනයක සිටිමින් තමා අපි කටයුතු කරන්නේ. යම් තොරතුරක් සියයට සියයක් සම්පූර්ණ වීම අවශ්‍ය

නෑ. එහි ගැබ්ව තිබෙන කාරණයේ බර සැලකිල්ලට ගෙන කටයුතු කරන්න පොලිස්පතිවරයාට සිදුවෙනවා, යනුවෙන් ප්‍රකාශ කළ බවට වාර්තාවේ[52].

ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල වීමට නියමිත බවට රාජ්‍ය බුද්ධි සේවයෙන් තොරතුරක් ලැබුණහොත් පොලිස්පතිවරයා වශයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද යනුවෙන් දිලීප පීරිස් මහතා අසන ලද ප්‍රශ්නයට පිළිතුරු වශයෙන්, එවැනි තොරතුරක් ලද විට ඒ හා සම්බන්ධව දෙපාර්තමේන්තුවේ සිටින විශේෂඥ දැනුමක් සහිත ඉහල නිලධාරීන් කැඳවා සාකච්ඡා කළ යුතුයි. පසුව එම තොරතුරු බුද්ධි තොරතුරක් වශයෙන් වර්ධනය කරගත යුතුයි. ඉන්පසුව එය භූමියේ ක්‍රියාත්මක කිරීමට පොලිස්පතිවරයා වගබලා ගත යුතුයි. එය තමා පොලිස්පතිවරයකුගේ වගකීම යනුවෙන් පොලිස්පති ප්‍රකාශ කරන ලදී[53].

ඔබට අතිරහස්‍ය වාර්තාවක් ලැබුණහොත් ඔබ එය එලෙසින්ම පහළ නිලධාරීන් වෙත යවන්නේ දැයි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා විමසන ලදී[54]. මම එසේ කරන්නේ නැහැ. මම කරන්නේ එම වාර්තාව හොඳින් අධ්‍යනය කරලා අවශ්‍ය උපුටා ගැනීම් කරලා පොලිස්පතිවරයාගේ සුදුසු නියෝග සමඟ පහළට යවන එක. මොකද රාජ්‍ය නායකයෙක් තරමටම, පොලිස්පතිත් ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් බැඳිලා ඉන්නවා. ඒ නිසා මම නියෝග දුන්නේ නැහැ. මම දන්නේ නැහැ කියන්න බැහැ. යැයි පොලිස්පති වික්‍රමරත්න මහතා ඊට පිළිතුරු දුන්නේය.[55] මෙම නඩු විභාගය 2022 ජනවාරි 18 වනදා තෙක් කල් තබන ලදී[56].

## 4 වැනි කාණ්ඩය : හිටපු ආරක්ෂක ලේකම්ට එරෙහි නඩුවේ විශේෂ කරුණු - HC (TAB)2021/2899

2021 නොවැම්බර් මස 22 වන දින පස්වරුවේ හේමසිරි ප්‍රනාන්දු මහතා ත්‍රිපුද්ගල මහාධිකරණය හමුවේ පෙනී සිටියේය[57]. විනිසුරු මඩුල්ල හමුවේ මෙදින නඩුව කැඳවනු ලැබූ අවස්ථාවේ දී විත්තිකරු වෙත චෝදනා පත්‍රයේ අඩංගු අධිචෝදනා කියවා දුන් අතර තමා සියලු චෝදනා වලට නිවැරදිකරු වන බව හේමසිරි ප්‍රනාන්දු මහතා පවසා සිටියේය[58]. විත්තිකරු වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා නීතිපතිවරයා ගොනු කර ඇති චෝදනා සම්බන්ධයෙන් මූලික විරෝධතාවක් ගොනු කරන බවට ප්‍රකාශ කළේය[59]. මූලික විරෝධතා ප්‍රතික්ෂේප කරමින් 2021 නොවැම්බර් 23 වන දින සිට නඩුව විභාගයට ගැනීමට විනිසුරු මඩුල්ල නියෝග කළේය[60].

මාධ්‍ය වාර්තා කරන පරිදි, පූජිත් ජයසුන්දර හා හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු යන මහත්වරුන්ට එරෙහිව ගොණු කර ඇති අධිචෝදනා විභාග කිරීම 2021 නොවැම්බර් 23 වන දින ආරම්භ කරන ලදී[61].

මාධ්‍ය වාර්තා කරන පරිදි, 2021 නොවැම්බර් 24 වන දින හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර හා හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු යන විත්තිකරුවන්ට එරෙහි නඩුවේ දෙවන දිනටත් සාක්ෂි ලබා දුන්නේ හිටපු රාජ්‍ය බුද්ධි ප්‍රධානී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතායි[62].

2021 නොවැම්බර් මස 25 වන දිනද පැමිණිල්ල වෙනුවෙන් නිලන්ත ජයවර්ධන මහතා සාක්ෂි ලබා දෙන ලදී. අප්‍රේල් 21 ස්ථාන 08 කට ප්‍රහාර එල්ල විය හැකි බවට 2019 අප්‍රේල් 20 වනදා පස්වරු 4.14 ට පමණ තමාට බුද්ධි තොරතුරක් ලැබුණු බව නිලන්ත ජයවර්ධන මහතා මෙදින අනාවරණය කරන ලදී[63]. කොළඹ විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණය හමුවේ ඔහු කියා සිටියේ තමා වහාම ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා හා පොලිස්පතිවරයා ඇතුළු වගකිවයුත්තන්ට එය දැනුම් දීමට පියවර ගත් බවයි[64]. එමෙන්ම, සාක්ෂිකරු කියා සිටියේ අප්‍රේල් 20 ලැබුණු බුද්ධි තොරතුර දුරකථන ඇමතුමකින් පොලිස්පතිවරයාට දැන්වූ බවය[65]. නමුත් එම තොරතුර සම්බන්ධයෙන් ඔහු එතරම් තැකීමක් නොකළ බව දැනුන නිසා ආරක්ෂක ලේකම්වරයාට ද ඒ බව දැනුම් දුන් බව ජයවර්ධන මහතා පවසන ලදී[66]. ඔහු සඳහන් කළේ එහිදී පොලිස්පතිවරයා එම තොරතුර ගැන බරපතල ලෙස නොතකන බව තමන්ට දැනෙන බවද, ආරක්ෂක ලේකම්වරයාට කියා සිටි බවයි[67].

2021 නොවැම්බර් මස 26 වන දින, මෙම නඩුවේදී විත්තිය විසින් මෙදින පළමු සාක්ෂිකරු වූ නිලන්ත ජයවර්ධන මහතාව ප්‍රශ්න කිරීමට ලක් කළ අතර, 2021 නොවැම්බර් 23 ලබාදෙන ප්‍රකාශයක් සම්බන්ධයෙන් පරස්පරතා ලකුණු කිරීමක් සිදු වූ අතර, විනිසුරුතුමන්ලා විසින් විත්තිය වෙත අවවාද කළේ නුසුදුසු දේශපාලනීකරණය වූ ප්‍රශ්න ඇසීමෙන් වළකින ලෙසයි[68]. මෙම නඩුව 2021 දෙසැම්බර් 13 වන දිනට නියම කරන ලදී [69].

2021 දෙසැම්බර් 13 වන දින, ශ්‍රී ලංකා යුධ හමුදාවේ හිටපු බුද්ධි අධ්‍යක්ෂ කොඩිතුවක්කු මහතාගේ සාක්ෂි මෙහෙයවීම නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් සුදර්ශන ද සිල්වා මහතා විසින් සිදු කරන ලදී[70]. ශ්‍රී ලංකා හමුදාවට බුද්ධි තොරතුරු ලැබෙන ආකාරය, සාමාන්‍ය තොරතුරක් බුද්ධි

තොරතුරු බවට පරිවර්තනය වන ආකාරය සහ මෙම ක්‍රියාවලියේදී අනුගමනය කළ යුතු පියවර මොනවාදැයි සාක්ෂිකරු පැහැදිලි කළේය[71]. අනාවරණය වූ පරිදි, 2017 – 2019 අප්‍රේල් කාල සීමාව තුළ සහරාන් හෂීම්ට එරෙහිව අවස්ථා 9කදී නිසි නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස සාක්ෂිකරු පොලිස්පතිවරයාට දන්වා ඇත[72]. 2019 අප්‍රේල් 04 වන දින රාජ්‍ය බුද්ධි සේවයට ලැබුණු තොරතුරු පළමු සාක්ෂිකාර නිලන්ත ජයවර්ධන මහතා 2019 අප්‍රේල් 09 වනදා පැවති ජාතික බුද්ධි මණ්ඩලයට (**National Intelligence Council)** ඉදිරිපත් කළේ දැයි ගරු විනිසුරුවරු සාක්ෂිකරුගෙන් විමසා සිටියහ[73]. 1 වන සාක්ෂිකරු ජාතික බුද්ධි මණ්ඩලයට අදාළ දිනයේදී කිසිදු තොරතුරක් ඉදිරිපත් නොකළ බව සාක්ෂිකරු පැවසුවේය[74].

2021 දෙසැම්බර් 14 වන දින, විත්තිකාර හිටපු ආරක්ෂක ලේකම් විසින් මාධ්‍යට කළ ප්‍රකාශයක් අන්තර්ගත වීඩියෝ පටයක් අධිකරණය තුළ වාදනය කළ අතර එය හා සබැදිව ඉංග්‍රීසි බසින් සැකසුන ලේඛනයක් අධිකරණයට පැමිණිලි පාර්ශවය විසින් ලබා දෙන ලදී[75]. එම වීඩියෝව දෙරණ පුවත් විකාශයක කොටසක් වූ අතර, 22/04/2019 දින ප්‍රවෘත්තියක් බව එම වීඩියෝවේ දිස්වන්නට විය[76]. එම වීඩියෝව අන්තර්ගත CD හා අධිකරණයට ලබා දුන් ඉහත සඳහන් කරන ලද ලේඛනය පැමිණිල්ලේ සාක්ෂි ලෙස ලකුණු කරන ලදී[77]. පැමිණිල්ලේ සාක්ෂිකරුවකු ලෙසින් දෙරණ මාධ්‍ය ජාලයේ ජ්‍යෙෂ්ඨ ප්‍රවෘත්ති කළමනාකරු, තරංග නිමේෂ් ජයකොඩි සාක්ෂි ලබා දෙන ලදී[78]. සමීර රොද්‍රිගු පියතුමන් ද සාක්ෂි ලබා දෙන ලදී[79]. මෙම ප්‍රහාරය වන විට දේවස්ථානය තුළ 800ත් 1000ත් අතර පිරිසක් සිටි බවටත් පිටතත් පිරිසක් සිටි බවටත් සාක්ෂිකරු ප්‍රකාශ කරන ලදී[80]. ප්‍රහාරය පිළිබඳ පෙර දැනුම් දීමක් ලැබී නොතිබුණු බවද සාක්ෂිකරු සාක්ෂි දෙනමින් ප්‍රකාශ කරන ලදී[81]. සාක්ෂිකාර උපාලි රත්නායක මහතාද මෙදින සාක්ෂි ලබා දෙන ලදී[82]. ඔහු 2019 වර්ෂයේදී අධ්‍යක්ෂ ජෙනරාල් - සංචාරක සංවර්ධන අධිකාරිය යන තනතුර දරා ඇත[83].

හිටපු ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය - රුවන් විජේවර්ධන මහතාද 2021 දෙසැම්බර් 14 වන දින සාක්ෂි ලබා දෙන ලදී[84]. ජනාධිපති විදෙස්ගත වන විට ඇතැම් අවස්ථා වලදී සාක්ෂිකරුව වැඩබලන ආරක්ෂක අමාත්‍ය ධුරයට පත් කර ඇති අතර, ඇතැම් අවස්ථා වලදී සාක්ෂිකරුට පත්වීම් ලිපිය ලැබෙන විට ජනාධිපතිතුමන් විදෙස්ගතව ලංකාවට පැමිණීමද සිදුවී අවසන් බව අනාවරණය විය[85]. 2018 වසරේ ඔක්තෝම්බර් මස සිදු වූ ව්‍යවස්ථා අර්බුදයෙන් පසුව අග්‍රාමාත්‍යවරයාව සහ තමාව ආරක්ෂක මණ්ඩල රැස්වීම් වලට කැඳවීමට ජනපති මෛත්‍රීපාල සිරිසේන කටයුතු නොකළ බව සාක්ෂිකරු පවසන ලදී[86]. පාස්කු ඉරුදින ප්‍රහාරය එල්ල වීමෙන් පසුව අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා තමාට දුරකථනයෙන් අමතා අරලියගහ මන්දිරයේ ආරක්ෂක මණ්ඩල රැස්වීමක් කැඳවන ලෙස දැනුම් දුන් බවටත්, එම අවස්ථාවේදී තමන් සිටියේ ආරක්ෂක අමාත්‍යාංශයේ බවටත්, එම අවස්ථාවේදී ආරක්ෂක අමාත්‍යාංශයට ත්‍රිවිධ හමුදාපතිවරු ඇතුළු ආරක්ෂක බලධාරීන් රැස්ව සිටිය බවටත්, තමන් ඔවුන් හට ආරක්ෂක මණ්ඩල රැස්වීමක් සඳහා අග්‍රාමාත්‍යවරයා සියලු දෙනාට අරලිය ගහ මන්දිරයට පැමිණීමට කිවූ බවට දැනුම් දුන් බවටත්, නමුදු කිසිවකු නැඟිට්ටේ නැති බවටත්, සාක්ෂිකරු ප්‍රකාශ කරන ලදී[87]. පසුව සාක්ෂිකරු හේමසිරි ප්‍රනාන්දු මහතාගෙන් මේ පිළිබඳ විමසා ඇති අතර, අගමැතිතුමා කැඳවන කිසිම රැස්වීමකට සහභාගී වෙන්න එපා යනුවෙන් ජනාධිපතිතුමා පවසා ඇති බවට හේමසිරි ප්‍රනාන්දු මහතා

සාක්ෂිකරුට පැවසූ බවට ප්‍රකාශ විය[88]. එම ස්ථානයේ රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානී නිලන්ත ජයවර්ධන මහතා  සිටි බවටත්, සාක්ෂිකරු ඔහුගෙන් ප්‍රහාරය ගැන තොරතුරු තමන්ට කළින්ම දැනුම් නොදුන්නේ ඇයි යනුවෙන් විමසූ බවටත්, එම අවස්ථාවේ නිලන්ත ජයවර්ධන මහතා තොරතුරු ලබාදීමට බැරි වීම පිළිබඳව සමාවෙන්න යනුවෙන් පැවසූ බවටත් සාක්ෂිකරු පවසන ලදී[89].

2021 දෙසැම්බර් 15 වන දින, පාස්කු ප්‍රහාරය පිළිබඳ සොයා බැලූ ජනාධිපති කොමිසම වෙත 2019 වසරේ ඉදිරිපත් කර තිබූ වෛද්‍ය වාර්තාවක් ගෙනහැර දක්වමින් තුන්වන සාක්ෂිකරු වන හිටපු ජාතික බුද්ධි ප්‍රධානී සිසිර මෙන්ඩිස් මහතාගෙන් සාක්ෂි කැඳවීමට පෙර අධිකරණ වෛද්‍ය නිලධාරීවරයා හමුවට යොමු කර වාර්තාවක් කැඳවීම සඳහා නියෝගයක් නිකුත් කරන්න යැයි පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් සුදර්ශන ද සිල්වා මහතා අධිකරණයෙන් ඉල්ලා සිටියේය[90]. විත්තිකාර හේමසිරි ප්‍රනාන්දු මහතා වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ මොහාන් වීරකෝන් මහතා එහිදී අධිකරණය හමුවේ සඳහන් කළේ, සාක්ෂිකරුට සාක්ෂි දීමට නොහැකි මට්ටමේ මානසික අපහසුතාවක් අදාළ වාර්තාව මඟින් සඳහන් කර නොමැති බවයි[91]. සිසිර මෙන්ඩිස් මහතා සාක්ෂි දීමට හැකි තත්වයක සිටින බවත්, ඔහුට පවතින රෝගී තත්ත්වය මත වරින් වර විවේක ගැනීමට සිදු විය හැකි බවත්, ඔහුගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ ශානක රණසිංහ මහතා සඳහන් කරන ලදී[92]. සිසිර මෙන්ඩිස් මහතාගේ සාක්ෂිය කැඳවීමට විනිසුරු මඩුල්ල තීරණය කරන ලදී[93]. කෙසේ නමුත් නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් සුදර්ශන ද සිල්වා මහතා අධිකරණයට දන්වා සිටියේ සිසිර මෙන්ඩිස් මහතා සාක්ෂිය සඳහා නොකැඳවීමට පැමිණිල්ල තීරණය කළ බවයි[94]. මෙම නඩු විභාගය 2022 ජනවාරි 18 වනදා තෙක් කල් තබන ලදී[95].

---

[1] This report based on CSR's trial monitoring on some days complimented by media reports

[2] Sirasa, 'News 1st Prime Time Sinhala News – 7 PM' (23 November 2021) <https://youtu.be/ruDYyKlETCQ?t=1395 > (Time duration: 24:50 – 25:45) accessed on 30th November 2021

[3] Sirasa, 'News 1st Prime Time Sinhala News – 7 PM' (22 November 2021) <https://youtu.be/Pf5sTYLBtiw?t=684 > (Time duration: 11:18 - 12:36) accessed on 30th November 2021,

හංසි නානායක්කාර, 'පූජිත්ට එරෙහිව සාක්ෂි දෙන්නැයි වත්මන් පොලිස්පතිට සිතාසි' (*මව්බිම*, 26 November 2021) <https://mawbima.lk/news-more/89746> accessed on 1st of December 2021,

Sirasa, 'News 1st Prime Time Sinhala News – 7 PM' (23 November 2021) <https://youtu.be/ruDYyKlETCQ?t=1393> (Time duration: 23:13 - 24:50) accessed on 30th November 2021

[4] Sirasa, 'News 1st Prime Time Sinhala News – 7 PM' (22 November 2021) <https://youtu.be/Pf5sTYLBtiw?t=684 > (Time duration: 11:18 - 12:36) accessed on 30th November 2021,

හංසි නානායක්කාර, 'පූජිත්ට එරෙහිව සාක්ෂි දෙන්නැයි වත්මන් පොලිස්පතිට සිතාසි' (*මව්බිම*, 26 November 2021) <https://mawbima.lk/news-more/89746> accessed on 1st of December 2021,

Sirasa, 'News 1st Prime Time Sinhala News – 7 PM' (23 November 2021) <https://youtu.be/ruDYyKlETCQ?t=1393> (Time duration: 23:13 - 24:50) accessed on 30th November 2021

[5] තිළිණි ද සිල්වා, 'පාස්කු ප්‍රහාරය වළක්වා ගැනීමට පියවර නොගැනීමේ වගකීම මට බාර ගන්න බෑ' (*ලංකාදීප ONLINE*, 25November 2021) < පාස්කු ප්‍රහාරය වළක්වා ගැනීමට පියවර නොගැනීමේ වගකීම මට බාර ගන්න බෑ - Lankadeepa Online > accessed on 1st of December 2021

[6] තිළිණි ද සිල්වා, 'පාස්කු ප්‍රහාරය වළක්වා ගැනීමට පියවර නොගැනීමේ වගකීම මට බාර ගන්න බෑ' (*ලංකාදීප ONLINE*, 25November 2021) < පාස්කු ප්‍රහාරය වළක්වා ගැනීමට පියවර නොගැනීමේ වගකීම මට බාර ගන්න බෑ - Lankadeepa Online > accessed on 1st of December 2021

[7] Hiru News, 'Hiru TV NEWS 6.55PM' (23 November 2021) <https://youtu.be/m_m1HoRbDkI?t=1800 > )Time duration: 30:00 - 30:12) accessed on 1 December 2021

[8] Sirasa, 'News 1st Prime Time Sinhala News – 7 PM' (23 November 2021) <https://youtu.be/ruDYyKlETCQ?t=1393> (Time duration: 24:50 - 25:45) accessed on 30th November 2021

Ada Derana, 'Ada Derana Prime Time News Bulletin' (23 November 2021) <https://youtu.be/krMXahiVbvg?t=1877 > )Time duration: 31:43 - 31:56) accessed on 1 December 2021

[9] Sirasa, 'News 1st Prime Time Sinhala News – 7 PM' (23 November 2021) <https://youtu.be/ruDYyKlETCQ?t=1393> (Time duration: 24:50 - 25:45) accessed on 30th November 2021

[10] Sirasa, 'News 1st Prime Time Sinhala News – 7 PM' (23 November 2021) <https://youtu.be/ruDYyKlETCQ?t=1393> (Time duration: 24:50 - 25:45) accessed on 30th November 2021

[11] Sirasa, 'News 1st Prime Time Sinhala News – 7 PM' (23 November 2021) <https://youtu.be/ruDYyKlETCQ?t=1393> (Time duration: 24:50 - 25:45) accessed on 30th November 2021

[12] Sirasa, 'News 1st Prime Time Sinhala News – 7 PM' (23 November 2021) <https://youtu.be/ruDYyKlETCQ?t=1393> (Time duration: 24:50 - 25:45) accessed on 30th November 2021

[13] Sirasa, 'News 1st Prime Time Sinhala News – 7 PM' (22 November 2021) <https://youtu.be/Pf5sTYLBtiw?t=684 > (Time duration: 11:18 - 12:36) accessed on 30th November 2021

[14] Trial monitoring report on 22nd of November 2021 – Case no: HC (TAB) 2900/21

[15] 'සියලු අධිචෝදනාවලට තමන් නිවැරදිකරු බව පූජිත් ජයසුන්දර කියයි' (<සියලු අධිචෝදනාවලට තමන් නිවැරදිකරු බව පූජිත් ජයසුන්දර කියයි - Sri Lanka News (newsfirst.lk)> accessed on 1 December 2021

[16] 'සියලු අධිචෝදනාවලට තමන් නිවැරදිකරු බව පූජිත් ජයසුන්දර කියයි' (<සියලු අධිචෝදනාවලට තමන් නිවැරදිකරු බව පූජිත් ජයසුන්දර කියයි - Sri Lanka News (newsfirst.lk)> accessed on 1 December 2021

[17] 'සියලු අධිචෝදනාවලට තමන් නිවැරදිකරු බව පූජිත් ජයසුන්දර කියයි' (<සියලු අධිචෝදනාවලට තමන් නිවැරදිකරු බව පූජිත් ජයසුන්දර කියයි - Sri Lanka News (newsfirst.lk)> accessed on 1 December 2021

[18] Trial monitoring report on 23rd of November, 2021 – Case No: HC (TAB) 2900/21

[19] Trial monitoring report on 23rd of November, 2021 – Case No: HC (TAB) 2900/21

[20] Trial monitoring report on 23rd of November, 2021 – Case No: HC (TAB) 2900/21

[21] Trial monitoring report on 23rd of November, 2021 – Case No: HC (TAB) 2900/21

[22] Hiru News, 'Hiru TV NEWS 6.55PM' (24 November 2021) < https://youtu.be/KZUbP8Jrlow?t=1616> (Time duration: 26:55 - 29:28) accessed on 1 December 2021

[23] Hiru News, 'Hiru TV NEWS 6.55PM' (24 November 2021) < https://youtu.be/KZUbP8Jrlow?t=1616> (Time duration: 26:55 - 29:28) accessed on 1 December 2021

[24] Trial monitoring report on 24th of November, 2021 – Case No: HC (TAB) 2900/21

[25] Trial monitoring report on 25th of November, 2021 – Case No: HC (TAB) 2900/21

[26] Trial monitoring report on 25th of November, 2021 – Case No: HC (TAB) 2900/21

[27] Trial monitoring report on 25th of November, 2021 – Case No: HC (TAB) 2900/21

[28] Trial monitoring report on 25th of November, 2021 – Case No: HC (TAB) 2900/21

[29] Trial monitoring report on 25th of November, 2021 – Case No: HC (TAB) 2900/21

[30] Trial monitoring report on 25th of November, 2021 – Case No: HC (TAB) 2900/21

[31] Trial monitoring report on 25th of November, 2021 – Case No: HC (TAB) 2900/21

[32] Trial monitoring report on 25th of November, 2021 – Case No: HC (TAB) 2900/21

[33] Trial monitoring report on 26th of November, 2021 – Case No: HC (TAB) 2900/21

[34] Trial monitoring report on 26th of November, 2021 – Case No: HC (TAB) 2900/21

[35] Trial monitoring report on 26th of November, 2021 – Case No: HC (TAB) 2900/21

[36] Trial monitoring report on 26th of November, 2021 – Case No: HC (TAB) 2900/21

[37] Ada Derana, 'Ada Derana Prime Time News Bulletin' (26 November 2021) >https://www.youtube.com/watch?v=4KjDo-BBcso&t=1600s) <Time duration: 26:40 - 27:06) accessed on 1 December 2021,
Hiru News, 'Hiru TV NEWS 6.55PM' (26 November 2021) < https://www.youtube.com/watch?v=CcNY6ePb-fg&t=1838s > )Time duration: 30:36 - 30:59) accessed on 1 December 2021,
Dilshan Tharaka, 'Easter attacks case: IGP noticed to appear in court'(*Daily news,* 27 November 2021)<https://www.dailynews.lk/2021/11/27/law-order/265829/easter-attacks-case-igp-noticed-appear-court > accessed on 1 December 2021

[38] Hiru News, 'Hiru TV NEWS 6.55PM' (26 November 2021) <https://www.youtube.com/watch?v=CcNY6ePb-fg&t=1838s > (Time duration: 30:36 - 30:59) accessed on 1 December 2021

[39] Ada Derana, 'Ada Derana Prime Time News Bulletin' (29 November 2021) <https://youtu.be/xXMgsN9s1iY?t=1314> (Time duration: 21:54 - 25:04) accessed on 1 December 2021

[40] Ada Derana, 'Ada Derana Prime Time News Bulletin' (29 November 2021) <https://youtu.be/xXMgsN9s1iY?t=1314> (Time duration: 21:54 - 25:04) accessed on 1 December 2021

[41] Ada Derana, 'Ada Derana Prime Time News Bulletin' (29 November 2021) <https://youtu.be/xXMgsN9s1iY?t=1314> (Time duration: 21:54 - 25:04) accessed on 1 December 2021

[42] Ada Derana, 'Ada Derana Prime Time News Bulletin' (29 November 2021) <https://youtu.be/xXMgsN9s1iY?t=1314> (Time duration: 21:54 - 25:04) accessed on 1 December 2021

[43] Ada Derana, 'Ada Derana Prime Time News Bulletin' (29 November 2021) <https://youtu.be/xXMgsN9s1iY?t=1314> (Time duration: 21:54 - 25:04) accessed on 1 December 2021

[44] කුමුදු ජයවර්ධන, 'පාස්කු ප්‍රහාරයේ බුද්ධි තොරතුර බලධාරීන්ට දැනුම් නොදුන් බව නිලන්ත ජයවර්ධන අධිකරණයේදී පිළිගනී' (*මව්බිම,* 29 November 2021) <https://mawbima.lk/news-more/89804 > accessed on 1 December 2021

[45] කුමුදු ජයවර්ධන, 'පාස්කු ප්‍රහාරයේ බුද්ධි තොරතුර බලධාරීන්ට දැනුම් නොදුන් බව නිලන්ත ජයවර්ධන අධිකරණයේදී පිළිගනී' (*මව්බිම,* 29 November 2021) <https://mawbima.lk/news-more/89804 > accessed on 1 December 2021

[46]Hiru News, 'Hiru TV NEWS 6.55PM' (29 November 2021) < https://youtu.be/dXvWfHmJwp0?t=1257> (Time duration: 20:56 - 24:49) accessed on 1 December 2021

[47] කුමුදු ජයවර්ධන, 'පාස්කු ප්‍රහාරයේ බුද්ධි තොරතුර බලධාරීන්ට දැනුම් නොදුන් බව නිලන්ත ජයවර්ධන අධිකරණයේදී පිළිගනී' (*මව්බිම,* 29 November 2021) <https://mawbima.lk/news-more/89804 > accessed on 1 December 2021

[48] කුමුදු ජයවර්ධන, 'පාස්කු ප්‍රහාරයේ බුද්ධි තොරතුර බලධාරීන්ට දැනුම් නොදුන් බව නිලන්ත ජයවර්ධන අධිකරණයේදී පිළිගනී' (*මව්බිම,* 29 November 2021) <https://mawbima.lk/news-more/89804 > accessed on 1 December 2021

[49] කුමුදු ජයවර්ධන, 'පාස්කු ප්‍රහාරයේ බුද්ධි තොරතුර බලධාරීන්ට දැනුම් නොදුන් බව නිලන්ත ජයවර්ධන අධිකරණයේදී පිළිගනී' (*මව්බිම,* 29 November 2021) <https://mawbima.lk/news-more/89804 > accessed on 1 December 2021

[50] Hiru News, 'Hiru TV NEWS 6.55PM' (29 November 2021) < https://youtu.be/dXvWfHmJwp0?t=1257> (Time duration: 20:56 - 24:49) accessed on 1 December 2021

'පොලිස්පති කවුද ?පොලිස්පති කියයි (වීඩියෝ)' (*හිරු NEWS*, 29 November 2021) <පොලිස්පති කවුද ? පොලිස්පති කියයි (වීඩියෝ) - Hiru News - Srilanka's Number One News Portal, Most visited website in Sri Lanka> accessed on 1 December 2021

[51] Hiru News, 'Hiru TV NEWS 6.55PM' (29 November 2021) < https://youtu.be/dXvWfHmJwp0?t=1257> (Time duration: 20:56 - 24:49) accessed on 1 December 2021

[52] Hiru News, 'Hiru TV NEWS 6.55PM' (29 November 2021) < https://youtu.be/dXvWfHmJwp0?t=1257> (Time duration: 20:56 - 24:49) accessed on 1 December 2021

[53] Hiru News, 'Hiru TV NEWS 6.55PM' (29 November 2021) < https://youtu.be/dXvWfHmJwp0?t=1257> (Time duration: 20:56 - 24:49) accessed on 1 December 2021

[54] Ada Derana, 'Ada Derana Prime Time News Bulletin' (29 November 2021) <https://youtu.be/xXMgsN9s1iY?t=1314> (Time duration: 21:54 - 25:04) accessed on 1 December 2021

[55] Ada Derana, 'Ada Derana Prime Time News Bulletin' (29 November 2021) <https://youtu.be/xXMgsN9s1iY?t=1314> (Time duration: 21:54 - 25:04) accessed on 1 December 2021

[56] Ada Derana, 'Ada Derana Prime Time News Bulletin' (29 November 2021) <https://youtu.be/xXMgsN9s1iY?t=1314> (Time duration: 21:54 - 25:04) accessed on 1 December 2021

[57] Sirasa, 'News 1st Prime Time Sinhala News – 7 PM' (22 November 2021) <https://youtu.be/Pf5sTYLBtiw?t=684 > (Time duration: 11:18 - 12:36) accessed on 30th November 2021

[58]හංසි නානායක්කාර, 'පාස්කු ප්‍රහාරය: චෝදනාවලට එරෙහිව හිටපු ආරක්ෂක ලේකම්ගෙන් මූලික විරෝධතාවක්' (22 November 2021) <https://mawbima.lk/news-more/89657 > accessed on 22nd December 2021

[59]හංසි නානායක්කාර, 'පාස්කු ප්‍රහාරය: චෝදනාවලට එරෙහිව හිටපු ආරක්ෂක ලේකම්ගෙන් මූලික විරෝධතාවක්' (22 November 2021) <https://mawbima.lk/news-more/89657 > accessed on 22nd December 2021

[60]හංසි නානායක්කාර, 'පාස්කු ප්‍රහාරය: චෝදනාවලට එරෙහිව හිටපු ආරක්ෂක ලේකම්ගෙන් මූලික විරෝධතාවක්' (22 November 2021) <https://mawbima.lk/news-more/89657 > accessed on 22nd December 2021

[61]Ada Derana, 'Ada Derana Prime Time News Bulletin' (23 November 2021) <https://youtu.be/krMXahiVbvg?t=1877 > )Time duration: 31:17 - 31:43) accessed on 1 December 2021

[62] Sirasa, 'News 1st Prime Time Sinhala News – 7 PM' (24 November 2021) <https://youtu.be/-dzhbshxXvE?t=1418 > (Time duration: 23:36 - 27:24) accessed on 30th November 2021

[63] Sirasa, 'News 1st Prime Time Sinhala News – 7 PM' (25 November 2021) <https://www.youtube.com/watch?v=kX3wjLAymlA> (Time duration: 24:45 - 27:23) accessed on 30th November 2021

[64] Sirasa, 'News 1st Prime Time Sinhala News – 7 PM' (25 November 2021) <https://www.youtube.com/watch?v=kX3wjLAymlA> (Time duration: 24:45 - 27:23) accessed on 30th November 2021

[65] Sirasa, 'News 1st Prime Time Sinhala News – 7 PM' (25 November 2021) <https://www.youtube.com/watch?v=kX3wjLAymlA> (Time duration: 24:45 - 27:23) accessed on 30th November 2021

[66] Sirasa, 'News 1st Prime Time Sinhala News – 7 PM' (25 November 2021) <https://www.youtube.com/watch?v=kX3wjLAymlA> (Time duration: 24:45 - 27:23) accessed on 30th November 2021

[67] Sirasa, 'News 1st Prime Time Sinhala News – 7 PM' (25 November 2021) <https://www.youtube.com/watch?v=kX3wjLAymlA> (Time duration: 24:45 - 27:23) accessed on 30th November 2021

[68] Trial monitoring report on 26th of November, 2021 – Case No: HC (TAB) 2899/21

[69] Dilshan Tharaka, 'Easter attacks case: IGP noticed to appear in court'(*Daily news,* 27 November 2021)<https://www.dailynews.lk/2021/11/27/law-order/265829/easter-attacks-case-igp-noticed-appear-court > accessed on 1 December 2021

[70] Trial monitoring report on 13th of December, 2021 – Case No: HC (TAB) 2899/21

[71] Trial monitoring report on 13th of December, 2021 – Case No: HC (TAB) 2899/21

[72] Trial monitoring report on 13th of December, 2021 – Case No: HC (TAB) 2899/21

[73] Trial monitoring report on 13th of December, 2021 – Case No: HC (TAB) 2899/21

[74] Trial monitoring report on 13th of December, 2021 – Case No: HC (TAB) 2899/21

[75] Trial monitoring report on 14th of December, 2021 – Case No: HC (TAB) 2899/21

[76] Trial monitoring report on 14th of December, 2021 – Case No: HC (TAB) 2899/21

[77] Trial monitoring report on 14th of December, 2021 – Case No: HC (TAB) 2899/21

[78] Trial monitoring report on 14th of December, 2021 – Case No: HC (TAB) 2899/21

[79] Trial monitoring report on 14th of December, 2021 – Case No: HC (TAB) 2899/21

"පාස්කු ප්‍රහාරය දා දේව මෙහෙය සිදුකළ පියතුමා අධිකරණයේදී දැඩිව හැඟුම්බරවෙයි  මතකයන් යළි මතක් –කරන්න එපා විනිසුරු මඩුල්ල කියයි" (Newshub.lk, 14 December 2021)

>පාස්කු ප්‍රහාරය දා දේව මෙහෙය සිදුකළ පියතුමා අධිකරණයේදී දැඩිව හැඟුම්බරවෙයි  මතකයන් යළි මතක් කරන්න – එපා විනිසුරු මඩුල්ල කියයි| News Sri Lanka | Latest News Sri Lanka| Breaking News Sri Lanka| News Hub| Gossip Sri Lanka < accessed on 14th of December 2021

[80] Trial monitoring report on 14th of December, 2021 – Case No: HC (TAB) 2899/21
"පාස්කු ප්‍රහාරය දා දේව මෙහෙය සිදුකළ පියතුමා අධිකරණයේදී දැඩිව හැඟුම්බරවෙයි  මතකයන් යළි මතක් කරන්න – එපා විනිසුරු මඩුල්ල කියයි" (Newshub.lk, 14 December 2021)

>පාස්කු ප්‍රහාරය දා දේව මෙහෙය සිදුකළ පියතුමා අධිකරණයේදී දැඩිව හැඟුම්බරවෙයි  මතකයන් යළි මතක් කරන්න – එපා විනිසුරු මඩුල්ල කියයි| News Sri Lanka | Latest News Sri Lanka| Breaking News Sri Lanka| News Hub| Gossip Sri Lanka < accessed on 14th of December 2021

[81] Trial monitoring report on 14th of December, 2021 – Case No: HC (TAB) 2899/21
"පාස්කු ප්‍රහාරය දා දේව මෙහෙය සිදුකළ පියතුමා අධිකරණයේදී දැඩිව හැඟුම්බරවෙයි  මතකයන් යළි මතක් කරන්න – එපා විනිසුරු මඩුල්ල කියයි" (Newshub.lk, 14 December 2021)

>පාස්කු ප්‍රහාරය දා දේව මෙහෙය සිදුකළ පියතුමා අධිකරණයේදී දැඩිව හැඟුම්බරවෙයි  මතකයන් යළි මතක් කරන්න – එපා විනිසුරු මඩුල්ල කියයි| News Sri Lanka | Latest News Sri Lanka| Breaking News Sri Lanka| News Hub| Gossip Sri Lanka < accessed on 14th of December 2021

[82] Trial monitoring report on 14th of December, 2021 – Case No: HC (TAB) 2899/21

[83] Trial monitoring report on 14th of December, 2021 – Case No: HC (TAB) 2899/21

[84] Trial monitoring report on 14th of December, 2021 – Case No: HC (TAB) 2899/21

[85] Trial monitoring report on 14th of December, 2021 – Case No: HC (TAB) 2899/21

[86] "අද දෙරණ 6.55 ප්‍රධාන පුවත් විකාශය -2021.12.14 | Ada Derana Prime Time News Bulletin "(Ada Derana, 14 December 2021) <https://www.youtube.com/watch?v=ijnONpQ3GEI < accessed on 15th of December 2021(Time duration:27:01 – (28:50

[87] "අද දෙරණ 6.55 ප්‍රධාන පුවත් විකාශය -2021.12.14 | Ada Derana Prime Time News Bulletin "(Ada Derana, 14 December 2021) <https://www.youtube.com/watch?v=ijnONpQ3GEI < accessed on 15th of December 2021(Time duration:27:01 – (28:50

[88] "අද දෙරණ 6.55 ප්‍රධාන පුවත් විකාශය -2021.12.14 | Ada Derana Prime Time News Bulletin "(Ada Derana, 14 December 2021) <https://www.youtube.com/watch?v=ijnONpQ3GEI < accessed on 15th of December 2021(Time duration:27:01 – (28:50

[89] "අද දෙරණ 6.55 ප්‍රධාන පුවත් විකාශය -2021.12.14 | Ada Derana Prime Time News Bulletin "(Ada Derana, 14 December 2021) <https://www.youtube.com/watch?v=ijnONpQ3GEI < accessed on 15th of December 2021(Time duration:27:01 – (28:50

[90] "හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය -Hiru TV NEWS 6:55 PM Live | 2021-12-15" (Hiru News, 15 December 2021) < https://youtu.be/y3C6VidEV_A?t=1839 > accessed on 16 December 2021 (Time duration:30:38 – 33:33)

[91] "හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය -Hiru TV NEWS 6:55 PM Live | 2021-12-15" (Hiru News, 15 December 2021) < https://youtu.be/y3C6VidEV_A?t=1839 > accessed on 16 December 2021 (Time duration:30:38 – 33:33)

[92] "හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය -Hiru TV NEWS 6:55 PM Live | 2021-12-15" (Hiru News, 15 December 2021) < https://youtu.be/y3C6VidEV_A?t=1839 > accessed on 16 December 2021 (Time duration:30:38 – 33:33)

[93] "හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය -Hiru TV NEWS 6:55 PM Live | 2021-12-15" (Hiru News, 15 December 2021) < https://youtu.be/y3C6VidEV_A?t=1839 > accessed on 16 December 2021 (Time duration:30:38 – 33:33)

[94] "හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය -Hiru TV NEWS 6:55 PM Live | 2021-12-15" (Hiru News, 15 December 2021) < https://youtu.be/y3C6VidEV_A?t=1839 > accessed on 16 December 2021 (Time duration:30:38 – 33:33)

[95] "හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය -Hiru TV NEWS 6:55 PM Live | 2021-12-15" (Hiru News, 15 December 2021) < https://youtu.be/y3C6VidEV_A?t=1839 > accessed on 16 December 2021 (Time duration:30:38 – 33:33)